*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

09 ශ්‍රේණිය **ක්‍රිස්තු ධර්මය** කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

**I කොටස**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. දෙවියන් වහන්සේ විසින් මවන ලද දේව මැවිල්ලේ උසස්ම මැවිල්ල මිනිසා වන්නේ,
    (1) ඔහු බුද්ධිමත්ව මවා ඇති හෙයිනි.
    (2) ඔහු දේව ස්වරූපය දරන නිසාය.
    (3) ඔහු අද්විතීය පුද්ගලයෙක් වන නිසාය.
    (4) දෙවියන් වහන්සේගේ ප්‍රඥාව ඔහු සතුව තිබෙන නිසාය.

02. මිනිසා දේව සබඳතාවයෙන් ඈත් වූයේ ඔහු,
    (1) උඩඟු වූ නිසාය . (2) දුෂ්ඨ වූ නිසාය.
    (3) ආත්මාර්ථකාමී වූ නිසාය. (4) පාපයට වැටුණු නිසාය.

03. මිහිපිට මිනිසා මැවීම සම්බන්ධයෙන් දෙවියන් වහන්සේ දුක් වූයේ,
    (1) මිනිසාගේ අඥානවන්තකම නිසාය. (2) මිනිසාගේ අකීකරුකම නිසාය.
    (3) මිනිසාගේ දැඩි දුෂ්ඨකම නිසාය. (4) මිනිසාගේ දැඩි ආශාව නිසාය.

04. දෙවියන් වහන්සේ අබිමුවෙහි කරුණාව ලැබූ මිනිසා වූයේ,
    (1) නෝවාය. (2) ආදම්ය. (3) කායින් ය. (4) ආබෙල්ය.

05. ඊශ්‍රායෙල් ජනතාවගේ ප්‍රථම රජලෙස සැලකෙන්නේ,
    (1) දාවිත් රජුය. (2) සාවුල් රජුය.
    (3) රෙහොබෝවම් රජුය. (4) සලමොන් රජුය.

06. කිතුණු ජීවිතයේ වැදගත්ම සන්නිවේදන මාධ්‍ය විය යුත්තේ,
    (1) රූපවාහිනියයි. (2) සඟරාවයි. (3) යාච්ඤාවයි. (4) කිතුණු පුවත්පතයි.

07. කිතුණු අප විසින් දිනපතා කරන යාච්ඤාවක තිබිය යුතු අංග ගණන වන්නේ,
    (1) 5 කි. (2) 6 කි. (3) 10 කි. (4) 8 කි.

08. 'අපට වරද කළ අයට අප කමා කළාක් මෙන් අපේ වරදට අපට කමා වුව මැනව.' යනුවෙන් යාච්ඤා කිරීමට මඟ පෙන්වීම මගින්,
    (1) බෙදාගැනීමේ ජීවිතයට අපව කැඳවයි.
    (2) දේවගරුබිය ඇති ජීවිතයකට අපව කැඳවයි.
    (3) පරීක්ෂාවන්ගෙන් මුදවා ගන්නා ලද ජීවිතයකට අපව කැඳවයි.
    (4) මනස්ථාපනයේ ජීවිතයකට අපව කැඳවයි.

09. 'අබ්බා' යන අරමීය යෙදුමෙහි අර්ථය වන්නේ,
    (1) ගුරු දේවයනි යන්නයි. (2) උතුමාණෙනි යන්නයි.
    (3) හිමියනි යන්නයි. (4) පියාණනි යන්නයි.

10. ජේසුස් වහන්සේ විසින් තම ප්‍රථම ප්‍රාතිහාර්යය සිදුකරනු ලැබුවේ,

(1) ජෙරුසලමේ දී ය. (2) කපර්ණවුමේදී ය.
(3) කානාහිදී ය. (4) නාසරෙත්හි දී ය.

11. දෙවියන් වහන්සේ කිතුණු අපෙන් බලාපොරොත්තු වන්නේ,

(1) සෑම ඉරුදිනකම දේවස්ථානයට යෑමයි.
(2) අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුක්තව කටයුතු කිරීමයි.
(3) හැමවිටම කිතුණු සාක්ෂිය අන්‍යයන් වෙත ගෙන යාමයි.
(4) බයිබල් තරඟවලින් ජයග්‍රහණය ලබා ගැනීමයි.

12. භාරදහසකට කෑමදීමේ ප්‍රාතිහාර්ය සිදුකිරීමට පෙර සෙනඟ ජේසුස් වහන්සේගේ දේශනාවලට සවන් දෙමින් උන්වහන්සේ සමඟ ගත කළ දින ගණන වන්නේ දින,

(1) 1 කි. (2) 3 කි. (3) 4 කි. (4) 7 කි.

13. දාවිත් හා සාවුල් යන රජවරුන් පිළිබඳ ඉතිහාසය සඳහන් වන්නේ ශුද්ධ බයිබලයේ,

(1) නික්මයාම පොතෙහිය. (2) උත්පත්ති පොතෙහිය.
(3) සාමුවෙල් පොතෙහිය. (4) රාජාවලිය පොතෙහිය.

14. දෙවිඳුන් යැදීමේදී හැමවිටම දෑස් පියා ගැනීමට අප මතකයේ තබා ගත යුත්තේ,

(1) දෑස් විවර කර යාච්ඤා කිරීම පාපයක් වන හෙයිනි.
(2) සිතිවිලි මගින් ඇස මෙහෙය වන හෙයිනි.
(3) ඇස නොමඟට යන හෙයිනි.
(4) මනසින් ආත්මයෙන් හා හොඳ සිහිකල්පනාවෙන් දෙවිඳුන් යැදිය යුතු හෙයිනි.

15. කපර්ණවුමේ සිටි රෝම රාජ්‍ය නිලධාරියා සේවය කළේ,

(1) මහාහෙරෝද් රජු යටතේය. (2) පිලාත් රජු යටතේය.
(3) යුවරජ හෙරෝද් යටතේය. (4) හෙරෝද් ඇන්ටිපස් රජු යටතේය.

16. වතුර මිදියුෂ කිරීමේ ප්‍රාතිහාර්ය සඳහා යොදා ගන්නා ලද ගල් භාජන ගණන වන්නේ,

(1) 6 කි. (2) 7 කි. (3) 12 කි. (4) 3 කි.

17. රෝම රාජ්‍ය නිලධාරියාගෙ පුත්‍රයා සුවය ලැබුවේ,

(1) මව තුළ තිබූ විශ්වාසය නිසාය. (2) පැමිණි දාසයන් තුළ තිබූ විශ්වාසය නිසාය.
(3) පුත්‍රයා තුළ තිබූ විශ්වාසය නිසාය. (4) පියා තුළ තිබූ විශ්වාසය නිසාය.

18. ජේසුස් වහන්සේ විසින් සිදුකරන ලද සරණ මංගල්‍ය සම්බන්ධ ප්‍රාතිහාර්ය සඳහන් කර ඇති ශුභාරංචි පොත වන්නේ,

(1) මතෙව් ශුභාරංචියයි. (2) මාක් ශුභාරංචියයි.
(3) ලූක් ශුභාරංචියයි. (4) ජොහාන් ශුභාරංචියයි.

19. 'යන්න ඔබේ පුත්‍රයා ජීවත් වෙනවා' මෙම ප්‍රකාශනය හා සම්බන්ධ වන්නේ,

(1) දාසයන් හා රෝම රාජ්‍ය නිලධාරියා ය. (2) ජේසුස් වහන්සේ හා රෝම රාජ්‍ය නිලධාරියා ය.
(3) සෙනඟ හා රෝම රාජ්‍ය නිළධාරියා ය. (4) නිවසේ වැසියන් හා රෝම රාජ්‍ය නිළධාරියා ය.

20. එදිනෙදා ජීවිතයේදී දේව වැඩ සිටීම අත්දැකීම තුළ අප,

(1) ලෞකිකව පූර්ණත්වයට පත් වේ. (2) අධ්‍යාත්මිකව පූර්ණත්වයට පත් වේ.
(3) ශාරීරිකව පූර්ණත්වයට පත් වේ. (4) සාමූහිකත්වය තුළ පූර්ණත්වයට පත් වේ.

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (1) දෙවියන් වහන්සේගේ සම්බන්ධතාවයෙන් ඈත් වූ මිනිසුන් අතරේ ජීවත් වූ, දැහැමි මිනිසා කවුද?

(2) දෙවි පියාණන් වහන්සේ මිනිසා මවා ඔහුට ආසිරි පතමින් පැවරූ කාර්යයන් දෙකක් ලියන්න.

(3) දෙවි පියාණන් වහන්සේ මිනිසාගේ ආහාර පිණිස මවා දුන්නේ මොනවාද?

(4) දාවිත්, සාවුල්ගේ ජීවිතය විනාශ නොකරන්නට හේතුව කුමක්ද?

(5) සාවුල් රජ දාවිත් විනාශ කිරීමට ලුහුබැඳ එන විට ඔහු ඇතුළු පිරිස සැඟවී සිටියේ කෙහේද?

(6) සාවුල් රජතුමාගේ පුතු කවුද?

(7) ජීවිතේ සෑම අවස්ථාවකම දේව කැමැත්ත සොයන්නට, ස්වර්ගයේ වැඩ සිටින යාච්ඤාව තුළ අපට උගන්වන්නේ කුමන කොටසින් ද?

(8) දෙවියන් වහන්සේ අපගේ දිව්‍ය පෝෂකයාණන් බව සනාථ කිරීමට පැරණි ගිවිසුමෙන් උදාහරණ 02 ක් ලියන්න. (ල. 2x8=16)

02. (1) දාවිත් රජතුමාගේ ධර්මිෂ්ටකම මැනවින් ප්‍රකාශ වූ අවස්ථා දෙකක් ලියන්න. (ල. 02)

(2) දාවිත් රජතුමා තුළ ඔබ දකින යහපත් ගුණාංග 03 ක් ලියන්න. (ල. 03)

(3) කිතුණු දරුවෙකු ලෙස සමාජය තුළ ප්‍රේමයෙන් යුක්තව ක්‍රියා කළ හැකි අවස්ථා 03 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

03. (1) ජේසුස් වහන්සේ විසින් අපට ඉගැන්වූ යාච්ඤාව හඳුන්වන්නේ කුමන නමකින්ද? (ල. 02)

(2) ජේසුස් වහන්සේ නිරන්තරයෙන් යාච්ඤාව තම ජීවිතයට අදාළ කරගත් අවස්ථා 03 ක් ලියන්න.(ල. 03)

(3) එම යාච්ඤාව තුළ අන්තර්ගත සාමූහිකත්ව ලකුණ සුවිශේෂී කරමින් (ඉස්මතු කරමින්) එම යාච්ඤාව ලියා දක්වන්න. (ල. 06)

04. (1) ජුදෙව් සමාජය තුළ දක්නට ලැබුණු චාරිත්‍ර 02 ක් ලියා දක්වන්න. (ල. 02)

(2) ජේසුස් වහන්සේ විසින් වතුර මිදියුෂ කිරීමේ ප්‍රාතිහාර්ය සිදුකරන අවස්ථාවේ මරියතුමියගේ ක්‍රියාකලාපය තුළින් කිතුණු අපට උගත හැකි ආදර්ශ 03 ක් ලියන්න. (ල. 03)

(3) ජේසුස් වහන්සේ අපගේ ජීවිතවලට නිරන්තරයෙන් ප්‍රාතිහාර්යයන් සිදුකරන බව අපි විශ්වාස කරමු. මේ ආකාරයෙන් ක්‍රිස්තුස් වහන්සේ විසින් සිදුකරන ලද යැයි ඔබ විශ්වාස කරන ඔබගේ ජීවිතයේ හෝ වෙනත් අයෙකුගේ ජීවිතයේ අත්දැකීමක් කෙටියෙන් ලියන්න. (ල. 06)

05. (1) ජේසුස් වහන්සේ භාරදහසකට කෑම සපයා දීම ප්‍රාතිහාර්ය සිදුකරන අවස්ථාවේ එහි සිටි සෙනඟ අතරේ තිබූ ආහාර ප්‍රමාණයන් කොපමණද? (ල. 02)

(2) ගැටළුවකට විසඳුම් සෙවීමේදී සැබෑ නායකයෙකු ලෙස ජේසුස් වහන්සේ ඉහත අවස්ථාවේදී ක්‍රියා කළ ආකාර 03 ක් ලියන්න. (ල. 03)

(3) සැබෑ කිතුණු අනුගාමිකයෙකු සතු විය යුතු ලක්ෂණ 6 ක් පෙළගස්වන්න. (ල. 06)

06. (1) ගලීලයට අයත් නගර දෙකක් නම් කරන්න. (ල. 02)

(2) ජේසුස් වහන්සේගේ සුවය අත්දුටු රාජ්‍ය සේවකයාගෙන් විදහා දැක්වුණු චරිත ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(3) ඔබගේ යාච්ඤාවන් අපේක්ෂාවෙන් සිටින අයෙකු වෙනුවෙන් මැදිහත් වෙමින් විශ්වාසයෙන් යුක්තව ඔබ විසින් කරන යාච්ඤාවක් ලියන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 2 ) 02. ( 4 ) 03. ( 3 ) 04. ( 1 ) 05. ( 2 ) 06. ( 3 ) 07. ( 1 ) 08. ( 4 ) 09. ( 4 ) 10. ( 3 )
11. ( 3 ) 12. ( 2 ) 13. ( 3 ) 14. ( 4 ) 15. ( 4 ) 16. ( 1 ) 17. ( 4 ) 18. ( 4 ) 19. ( 2 ) 20. ( 2 )

## II කොටස

01. (1) නෝවා

(2) 1. දරුසම්පත් ලබා වැඩි වර්ධනය වන්න. 2. ලොවපුරා පැතිර එය යටත්කර ගන්න.
3. සියලු සතුන් කෙරෙහි ආධිපත්‍ය පතුරුවන්න.

(3) ධාන්‍ය දරන සියලු පැළෑටි හා බීජ සහිත ඵලදරන සියලු ගස්වැල්

(4) සාවුල් දෙවියන්වහන්සේගේ අභිෂේක ලක් තැනැත්තෙක් වීම.

(5) එන්ගෙදියේ පාළුකරයේ

(6) ජොනතන්

(7) ඔබ වහන්සේගේ කැමැත්ත ඉටුවේවා යන්නයි.

(8) 1. පාළුකරයේදී ඊශ්‍රායෙල් ජනයාට ආහාර ලබා දීම.
2. ශාරපත් හි වැන්දඹු ස්ත්‍රීය මගින් හා කපුටන් මගින් එලියා දිවැසිවරයා පෝෂණය කිරීම.

02. (1) 1. එන්ගෙදියේදි සාවුල්ගේ ජීවිතය මිදීම. 2. මෙපිබොෂෙත්ට කරුණාව දැක්වීම.

(2) 1. පළිගැනීම වෙනුවට ප්‍රේම කිරීම. 2. සමාව දීම.
3. දේව ගරුබිය 4. යටහත් පහත්ව ක්‍රියා කිරීම.
5. දෙවියන් වහන්සේ විසින් කැපකරන ලද පුද්ගලයන්ට විශේෂත්වයක් දැක්වීම.

(3) සිසුන් විසින් සපයා ඇති පිළිතුරු වල නිවැදි බව සලකා බලා ලකුණු ලබා දෙන්න.

03. (1) ස්වාමින්ගේ යාච්ඤාව, පවුලේ යාච්ඤාව, ස්වර්ගයේ වැඩ සිටින යාච්ඤාව

(2) 1. තම ශ්‍රාවකයන් තෝරා ගැනීමට පෙර
2. ප්‍රාතිහාර්යයන් සිදු කිරීමට ප්‍රථම.
3. සිය ප්‍රසිද්ධ මෙහෙය ආරම්භ කිරීමට පෙර.

(3) සාමූහික ලක්ෂණ 6 ඉස්මතු කරමින් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

04. (1) 1. තම නිවසට පැමිණෙන ආගන්තුකයන්ගේ පාද සෝදා පිළිගැනීම.
2. විවාහ මංගල උත්සවයක් දින හතක් පැවත්වීම.

(2) 1. හැම විටම අපගේ ජීවිත ගැටලු හා අවස්ථා ජේසුස් වහන්සේ වෙත ගෙන ඒම.
2. ක්‍රිස්තුස් වහන්සේ දේව පුත්‍රයා බව විශ්වාස කරමින් උන්වහන්සේ මත රැඳි සිටීම්.
3. ජේසුස් වහන්සේට කීකරු වෙමින් උන්වහන්සේගේ හඬට ඇහුම්කම් දීම.
4. සිසුන් විසින් සපයා ඇති පිළිතුර

(3) සිසුන් විසින් සපයා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

05. (1) රොටීහතක් හා මසුන් ස්වල්පයක්

(2) 1. සෙනඟගේ ශාරීරික අවශ්‍යතා අවබෝධකර ගැනීම.
2. දයානුකම්පාවෙන් ගැටළුවට විසඳුම් සෙවීම.
3. විසඳුම් සෙවීමේදී ශ්‍රාවකයන්ද සම්බන්ධ කර ගැනීම.

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

(3) 1. අන්‍යයන්ගේ අවශ්‍යතාවලට සංවේදී වීම.
2. ඇහුම්කන් දීම.
3. නිතරම සාකච්ඡා මගින් විසඳුම් සෙවීම.
4. දයාවෙන් හා කරුණාවෙන් සිටීම.
5. ජීවිත සාක්ෂිය අන්‍යයන් සමඟ බෙදා ගැනීම.
6. අන්‍යයන්ගේ අධ්‍යාත්මික පෝෂණය වෙනුවෙන් වැයවෙමින් ක්‍රියා කිරීම.

06. (1) 1. කානා නුවර 2. කපර්ණවුම

(2) 1. ඔහු රෝම නිලධාරියෙකු වුවත් ජේසුස් වහන්සේ විශ්වාස කිරීම.
2. තමා බලාපොරොත්තු වූ ආකාරයට උන්වහන්සේ ක්‍රියා නොකලත් උන්වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් සිටීම.
3. ජේසුස් වහන්සේට කීකරු වීම.
4. දුරකතර ගෙවාගෙන උන්වහන්සේ සොයා පැමිණීම.

(3) ලියා ඇති යාච්ඤාව අවස්ථානෝචිතව කරුණු 6 ක් වත් අඩංගු වන සේ ලියා ඇත්නම් ලකුණු 6 ක් වත් අඩංගු වන සේ ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

<u>ලකුණු පිරිනැමීම</u>

**I කොටස**

| | | |
|---|---|---|
| 1 වන ප්‍රශ්නයේ ප්‍රශ්න 8 සඳහා ලකුණු | **8 x 2 =** | **16** |
| **02 වන ප්‍රශ්නයේ සිට 06 වන ප්‍රශ්නය** | | |
| **දක්වා තෝරාගත් ප්‍රශ්න 4 කට** | **4 x 11 =** | **<u>44</u>** |
| **මුළු ලකුණු** | | **<u>60</u>** |

**02 - 06 දක්වා ප්‍රශ්නවල අනු කොටස්වලට ලකුණු ලබා දීම**

| | | |
|---|---|---|
| (1) - | ලකුණු | 2 |
| (2) - | ලකුණු | 3 |
| (3) - | ලකුණු | <u>6</u> |
| | ලකුණු | <u>11</u> |